# බුදු සමයෙහි පිළිබිඹුවන කළමනාකරණය සංකල්පයෙහි අධ්‍යාපනමය අගය

අධ්‍යාපන දර්ශනපති (M. Phil. In EDUCATION)
පශ්චාත් උපාධි පාඨමාලාවේ අවශ්‍යතා සපුරාලීම
සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධනය
1992

වරදිවෙල විජයසුමන හිමි,
(අධ්‍යාපනවේදී විශේෂ - ගෞරව)
ලියාපදිංචි අංකය :- 92/M.Phil/20
විභාග අංකය :- M.Phil. 274

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ.

UCLIB
469578

## සාරාංශය.


මුල් බුදු සමයෙහි, විනය හා සූත්‍ර පිටකයන්හි පිළිබිඹුවන බෞද්ධ කළමනාකරණය සංකල්පය අනාවරණය කර ගැනීම, වර්තමාන ලෝකයට එම සංකල්පයෙහි ඇති අදාළත්වය සහ එහි අධ්‍යාපනමය අගය විමර්ශනය කිරීම මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයෙහි අරමුණ වේ.

මෙහි පළමු පරිච්ඡේදයෙන් බුදුසමය පහළ වූ ඓතිහාසික පසුබිම හා දාර්ශනික පසුබිම මුලින්ම විමර්ශනයට ලක් කෙරේ. අනතුරුව මුල් බුදුසමය ප්‍රකට කරන කළමනාකරණය සංකල්පය පිළිබඳව අර්ථ කථනද, කළමනාකරණය සංකල්පය පිළිබඳ නූතන අර්ථ කථනද විවරණය වේ. බුදුරදුන් ගේ කාර්ය භාරය තුළින් ප්‍රකට වන කළමනාකරණමය ලක්ෂණ ද මෙහි දී විමර්ශනය කෙරේ.

දෙවැනි පරිච්ඡේදයෙහි, බුදු සමය ප්‍රකට කරන පුද්ගල කළමනාකරණය සංකල්පය විග්‍රහයට ලක්වේ. එහි දී පුද්ගලයා පිළිබඳ බෞද්ධ සංකල්පය විචාරාත්මකව අධ්‍යයනය කෙරිණි. පූර්ණ පුද්ගල කළමනාකරණයට බාධක වන අයෝග්‍ය මනෝභාව සන්තතිය පිළිබඳව විවරණය කොට යෝග්‍ය මනෝභාව වර්ධනය කළයුතු අයුරු ද ප්‍රකට වේ. අනතුරුව පුද්ගල කළමනාකරණමය ක්‍රමෝපාය අනුගමනය මගින් පුද්ගලයා සාක්ෂාත් කර ගන්නා කළමනාකරණමය ආකෘති වන බුදු, පසේබුදු, මහ රහත් යන සංකල්ප වලින් පොදු ආකෘතිය වන රහත් තත්ත්වය පිළිබඳව පූර්ණව විවරණය කෙරේ. එසේම පූර්ණ පුද්ගල කළමනාකරණයෙහි ප්‍රාප්ති අවස්ථා ද විමර්ශනාත්මකව ඉදිරිපත් කරන ලදි. කළමනාකරණමය ක්‍රියාවලිය උදෙසා පූර්වෝක්ත පුද්ගල කළමනාකරණය පිළිබඳ බෞද්ධ සාධක ප්‍රායෝගිකව භාවිත කිරීම පිළිබඳවද විමර්ශනය කෙරිණ.

තෙවන පරිච්ඡේදයෙහි පුද්ගලයා අයත්වන සමාජය කළමනාකරණය පිළිබඳව බුදු සමයෙහි පිළිබිඹු වන සංකල්ප සාකච්ඡාවට ලක් විය. සංඝ සමාජය කළමනාකරණය හා අදාළ සාධක විමර්ශනය කර ඉන් පසුව ගිහි සමාජය කළමනාකරණයට පාදක වූ ලෞකික අගයන් සහිත සාධක ඉදිරිපත් කරමින් දීඝ නිකායේ

සිඟාල සූත්‍රය පසුබිම් කරගත් සමාජ කළමනාකරණය පිළිබඳ සාධකද, යහපත් රාජ්‍ය කළමනාකරණයත් මඟින් ජනිත කෙරෙන සමාජ කළමනාකරණයේ ස්වභාවයද මෙහි දී විවරණය වේ.

සිව්වැනි පරිච්ඡේදය ආයතන කළමනාකරණය නම් වේ. එහිදී මුල් බුදු සමයෙහි පැනෙන ආරාම පාලනය පිළිබඳ සාධක ඇසුරින් ප්‍රකට වන කළමනාකරණමය ලක්ෂණ විග්‍රහ වේ. ආයතනයක් වශයෙන් ආරාම කළමනාකරණයෙන් ගම්‍ය වන කළමනාකරණමය ලක්ෂණ නූතන අධ්‍යාපන ආයතන කළමනාකරණය කෙරෙහි උපයෝගී කරගත යුතු අයුරු ආරාමික වත් පිළිවෙත් කළමනාකරණය, භෞතික හා මානව සම්පත් කළමනාකරණය, ආරාමික අධ්‍යාපන කළමනාකරණය ආදිය ඇසුරින් විග්‍රහයට ලක් කෙරේ.

සම්පත් කළමනාකරණය පිළිබඳ වූ පස්වැනි පරිච්ඡේදයෙහි මානව සම්පත් කළමනාකරණය, මානව සම්පත හා බැඳුනු ශ්‍රමය කළමනාකරණය, භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳව සංඝ සමාජය තුළ විද්‍යමාන ලක්ෂණ සාකච්ඡාවේ. සංඝ සමාජයේ ප්‍රාථමික අවශ්‍යතා පිළිබඳ කළමනාකරණය පිළිබඳව ද, අනතුරුව ගිහි ජීවිතය හා බැඳුනු ධන සම්පත් කළමනාකරණය පිළිබඳවද දීර්ඝ වශයෙන් මුල් බුදු සමය ආශ්‍රිතව ප්‍රකට කෙරිණ.

අධ්‍යාපන කළමනාකරණය නම් වූ හයවෙනි පරිච්ඡේදයෙහි අධ්‍යාපනයෙහි ඇති ආගමික නැඹුරුව විමසීම තුළින් ප්‍රවේශ වී අධ්‍යාපනය සැබැවින්ම ක්‍රියාත්මක වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව මුල් බුදු සමය ඇසුරින් විග්‍රහ කෙරේ. ගුරු භූමිකා කළමනාකරණය, ඉගැන්වීමේ මූල ධර්ම කළමනාකරණය, පන්ති කාමර කළමනාකරණය පිළිබඳව මුල් බුදු සමයෙහි මූලාශ්‍ර ඇසුරින් විස්තර කෙරිණ. විශේෂයෙන් බුද්ධ ගුරු භූමිකාවෙහි ඉගැන්වීමේ ශිල්ප ක්‍රම භාවිතය ගැන අවධානයක් යොමු නොකලේ ඒ පිළිබඳව අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වෙනත් අධ්‍යයනයන්හිදී විමර්ශනය කොට ඇති හෙයිනි.

සමස්තයක් ලෙස මේ සෑම පරිච්ඡේදයකම බුදු සමයෙන් ප්‍රකට

වන කළමනාකරණමය සංකල්පය ප්‍රායෝගිකව අධ්‍යාපන කළමනාකරණයෙහි යොදා ගත හැකි අයුරු විමර්ශනය වේ. එසේම ඕනෑම කළමනාකාරීත්ව රටාවක් උදෙසා එයින් ලදහැකි ආභාසය පොදුවේ විවරණය කෙරේ.

නිගමන හා යෝජනා වශයෙන් නම් කෙරුණු හත්වන පරිච්ඡේද යෙහි මූලිකම අභිප්‍රාය වූයේ බුදු සමයෙහි පිළිබිඹු වන කළමනාකරණය සංකල්පය අධ්‍යාපනමය වශයෙන් අගය කරමින් නූතන අධ්‍යාපන කළමනාකරණය සඳහා අදාළ කරගත හැකි අයුරු ඉතා සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමයි.